මිනිපේ ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය

------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 11 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට මිනිපේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) පුරනැගුම ව්‍යාපෘතියෙන් මිනිපේ ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත පරිත්‍යාග කර තිබුණු රු.1,358,902 ක ලී බඩු හා කාර්යාල උපකරණ ගිණුම්ගතකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධනය සඳහා දරා තිබුණු රු.2,707,164 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) පුරනැගුම ව්‍යාපෘතිය යටතේ කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් පළාත් පාලන කොමසාරිස් නමින් පවත්වාගෙන ගිය ස්ථාවර තැන්පත් ගිණුමේ ශේෂය රු.383,870.30 ක් ගිණුම්ගතකර නොතිබුණි.

(ඈ) සභාවට අයත් ජල යෝජනා ක්‍රම 2 ක් සංවර්ධනය වෙනුවෙන් වැයකර තිබූ රු.2,114,719 ක වටිනාකම ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) කර්මාන්ත ණයහිමියන් රු.216,000 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඊ) කර්මාන්ත ණයගැති ශේෂය රු.246,788 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි.

1.3.2 අසම්භාව්‍ය බැරකම්

------------------------

කඩ කාමර කුලී නොගෙවීම හේතුවෙන් කඩ හිමියන් 20 කට විරුද්ධව සභාව විසින් ගොනුකල නඩු 20 ක් හා කැබ් රථයක් සම්බන්ධයෙන් විභාගවන නඩුව පිළිබඳව ගිණුම්වලින් අනාවරණය කර නොතිබුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 7 ක එකතු වටිනාකම රු.22,533,012 ක් විය. ඒ පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව වසරක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.9,418,983 ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 3 ක එකතු වටිනාකම රු.19,733,474 ක් විය. එ් පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව වසරක කාලයක් ඉක්මවා තිබුණු ශේෂයන්හි එකතුව රු.4,619,945 ක් විය.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.77,260,873ක් වූ ගිණුම් විෂයයන් 4 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|---|
| | | **රු.** | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 351,181 | කල් ඉකුත් වූ තැන්පතු 7 කට අදාළ වටිනාකම නිරවුල් කිරීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (අ) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/03 දරන මධ්‍යම පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ | | |
| | (i) 10 ඡේදය | | කඩ කාමර අතුරු බදු දීම නොකළ යුතු වුවත්, බදු කරුවන් විසින් පුද්ගලයන් 18 දෙනෙකු වෙත අතුරු බදු දීම සිදු කර තිබුණි. |
| | (ii) 12 ඡේදය | | ගිවිසුම්ගත බදුකරුට කිසිදු ලෙසකින් කඩ කාමර ව්‍යුහය වෙනස් කිරීමට අයිතියක් නොමැති වුවත්, කඩ කාමර 5 ක ව්‍යුහය වෙනස්කර තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,541,312 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,202,234 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 553,942 | 592,883 | 484,918 | 441,988 | 583,942 | 543,881 | 460,005 | 341,174 |
| කුලී | 3,238,461 | 3,881,436 | 3,371,479 | 3,586,969 | 3,680,180 | 3,354,321 | 2,949,505 | 3,017,036 |
| බලපත්‍ර ගාස්තු | 2,068,000 | 1,989,272 | 1,989,272 | - | 1,843,000 | 2,619,236 | 2,619,236 | - |
| වෙනත් ආදායම් | 6,271,500 | 7,472,665 | 8,087,450 | 3,987,281 | 4,947,000 | 7,885,240 | 8,636,397 | 5,280,601 |
| | 12,131,903 | 13,936,256 | 13,933,119 | 8,016,238 | 11,054,122 | 14,391,734 | 14,881,274 | 8,724,561 |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

(අ) සභාව සතු කඩ කාමරවල අයිතිය නිරවුල් කරගෙන කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ ඇති පෞද්ගලික ආයතන, හෝටල් සහ වෙළඳසැල් වලින් කසළ බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.3 වරිපනම් හා බදු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.341,174 ක් වූ අතර, ඉන් වර්ෂය තුළදී අයකර තිබුණේ රු.32,027ක් පමණි.

(ආ) සභා බලප්‍රදේශය තුළ වරිපනම් අයකළ යුතු රාජ්‍ය ආයතනවලින් 2017 දෙසැම්බර් 31 දිනට රු.31,684 ක වරිපනම් බදු ශේෂයක් අයකර ගෙන නොතිබුණි.

2.2.4 කුලී

-------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ ශේෂය රු.3,380,147 ක් හා වර්ෂයේ බිල් කිරීම රු.1,230,866 ක් විය. ඉන් වර්ෂය තුළදී අයකරගෙන තිබුණේ හිඟයෙන් රු.104,170 ක් හා බිල් කිරීම්වලින් රු.557,772 ක් පමණි.

(ආ) හසලක නගරයේ අධිකරණ සංකීර්ණයක් පවත්වාගෙන යැමට දුන් ගොඩනැගිල්ලෙන් ලැබිය යුතුව තිබූ රු.103,500 ක මුදල වසර 20 ක් ගතවී තිබුණද, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 වෙනත් ආදායම්

--------------------

(අ) ජල ගාස්තු

-------------

සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟහිටි ජල ගාස්තු ශේෂය රු.1,792,586 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.3,116,020 ක් විය. ඉන් වර්ෂය තුළදී අයකර ගෙන තිබුණේ හිඟයෙන් රු.690,423 ක් හා බිල් කිරීම්වලින් රු.2,341,282 ක් පමණි. සමාලෝචිත වර්ෂයේ අවසානයට මුළු හිඟය රු.1,883,222 ක් විය.

(ආ) දැන්වීම් පුවරු ගාස්තු

-------------------------

සභා බල ප්‍රදේශයේ දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් අය කළ යුතු ගාස්තු රු.33,750 ක් හා විවිධ ආයතනවලින් ප්‍රදර්ශනය කර තිබූ පුවරුවලින් ගාස්තු අයකර නොතිබුණි.

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.770,958 ක් හා මුද්දර ගාස්තු රු.1,321,650 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යසාධනය

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ඉටු නොකළ කර්තව්‍යයන්

-------------------------------

සභා බලප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය හා පොදු පහසුකම් ඉහළ නැංවීම ප්‍රාදේශීය සභාවකින් ඉටු විය යුතු ප්‍රධාන කාර්යයක් වුවද, කාණු පද්ධති පිරිසිදු කිරීම හා නගරය පිරිසිදුව තබා ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

-----------------------------------------------------

සභාව සතු ජල යෝජනා ක්‍රම 2 ක් රු.2,114,719 ක් වැය කර අලුත්වැඩියා කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ නව ජල පරිභෝකයින් 21 කට පමණක් ජලය සපයා තිබුණි.

(ඇ) අපේක්ෂිත ප්‍රතිලාභ (out come)ලබා නොගැනීම

------------------------------------------------------------

ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ කාර්යයන් 02 ක් ඉටු කිරීම සඳහා රු.15,163,083ක් වැය කර අපේක්ෂිත නිමවුම් මට්ටම (out put) අත්පත් කරගෙන තිබූ නමුත් අපේක්ෂිත ප්‍රතිලාභ (out come) අත්පත් කරගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| කර්තව්‍යයන් | 2017 දෙසැම්බර් 31 දක්වා වැය කළ මුදල | නිරීක්ෂණ |
|---|---|---|
| | රු. | |
| බහුකාර්ය ගොඩනැගිල්ල | 14,463,083 | පුර නැගුම ව්‍යාපෘතිය යටතේ ඉදිකල බහුකාර්ය ගොඩනැගිල්ලේ මහජන පුස්තකාලය, තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය, සෞඛ්‍ය මධ්‍යස්ථානය, මාතෘ හා ආයුර්වේද මධ්‍යස්ථානය හා ප්‍රජා ශාලාව යනාදිය ස්ථාපිත කිරීමට යෝජනා කර තිබුණ ද, ඒවා ස්ථාපිත කර නොතිබුණි. මෙම ගොඩනැගිල්ලෙහි බිම් මහල හා දෙවන මහල කිසිදු ප්‍රයෝජනයක් නොගෙන නිෂ්කාර්යව පැවතුණි. |
| හසලක කොළොංගොඩ සතිපොළ | 700,000 | වෙළඳුන්ගේ අවශ්‍යතාවය පිළිබඳව නොසලකා තොග පොළේ කෙළවරක ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණු බැවින් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. තවද සතිපොළ අසල පොදු වැසිකිලිය සංවර්ධනය කර තිබුණද, භාවිතයට ගෙන නොතිබුණි. |
| | 15,163,080 | |

(ඈ) ක්‍රියාත්මක නොකළ කර්තව්‍යයන්

-----------------------------------------

සමාලෝචිත වර්ෂයේදී කර්තව්‍යන් 5 ක් ඉටු කිරීම සඳහා රු.160,000 ක ප්‍රතිපාදන සලසා ගෙන ඇතත්, ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

සභා බල ප්‍රදේශයෙන් දිනකට එකතුකරන මෙට්‍රික් ටොන් එකක කසළ ප්‍රමාණය දිරන හා නොදිරන වශයෙන් වෙන්කර හසලක කොම්පෝස්ට් අංගනය වෙත රැගෙන ගොස් දිරන කසළ කට්ටි ක්‍රමය අනුව පොහොර නිෂ්පාදනය කර තිබූ අතර, නොදිරන කසළ එම භූමියේ එක් ස්ථානයක ගොඩගසා පුළුස්සා පරිසරයට අහිතකර ලෙස බැහැර කර තිබුණි. කොම්පෝස්ට් නිෂ්පාදනය කර තිබුණද, අලෙවි කිරීම සඳහා නිසි සැලසුමක් ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් විශාල කොම්පෝස්ට් ප්‍රමාණයක් ගොඩගසා තිබුණි. කසළ කළමනාකරණය සඳහා ව්‍යාපෘති භූමියේ ගොඩනැගිල්ලක් ඉදිකර පැවතුණද එහි සභාවේ අබලි ද්‍රව්‍ය හා වාහනයක් දමා තිබුණි. කොලොංගොඩ සතිපොළෙහි එකතුවන කැළි කසළ පොළ අසල භූමියක පරිසරයට හානිවන අයුරින් ගොඩගසා තිබුණි.

(ඊ) පාරිසරික ගැටළු

--------------------

නොදිරන කසළ සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර, කසළ ව්‍යාපෘතිය ආශ්‍රිතව විවෘතව දහනය කිරීම සිදු කර තිබුණි. දාහකයක් නොමැති වීමෙන් පරිසරය දූෂණයට ලක් වෙමින් පැවතුණි.

(උ) තිරසාර සංවර්ධන ඉලක්ක

------------------------------

සභාව විසින් තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟා කර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු වෙළඳ සංකීර්ණයේ ඉහළ මහලේ කඩ කාමර සභාව විසින් ඉදි නොකර පහත මහලේ බදුකරුවන්ටම ඉදිකර ගැනීමට අවස්ථාව සලසා දී තිබුණු අතර, මෙහිදී ටෙන්ඩර් පටිපාටිය අනුගමනය නොකිරීම මෙන්ම එකවර මුදල් අය කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ සමස්ථ ජල පාරිභෝගිකයින් සංඛ්‍යාව 1360 ක් විය. ඉන් ජලමනු සවිකර තිබුණේ 433 දෙනෙකු සඳහා පමණක් වන අතර, ඉතිරි 927 දෙනෙකුගෙන් රු.200 ක ස්ථාවර ගාස්තුවක් අයකර තිබුණි.

(ඇ) 2015 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන සඳහා සභාව වෙත ලබා දී තිබුණු රු.1,315,810 ක මුදලක් අපේක්ෂිත ප්‍රතිලාභ ඉටුකිරීමට කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ආ) 2017 ඔක්තෝබර් මස සභාව විසින් හසලක පුස්තකාලය සඳහා රු.131,110 ක් වටිනා පොත් 460 ක් මිලදී ගෙන මාස 04 ක් ගත වුවද, එම පොත් පාඨක ප්‍රයෝජනයට ලබා දී නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

---

සේවක පුරප්පාඩු හා අතිරික්ත

---

අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය අතර තනතුරු 6 ක පුරප්පාඩු 18 ක් පැවතුණු අතර, එක් තනතුරක අතිරික්ත 02 ක් පැවතුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) හසලක කඩ කාමර 20 ඉදිකළ ඉඩම පවරාගෙන නොතිබුණු අතර, කඩ කාමර වලින් අය කළයුතු කුලියද, විධිමත්ව අයකරගෙන නොතිබීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දින වනවිට කඩ කාමර 32 කින් රු.3,378,227 ක මුදලක් අයකරගත යුතුව පැවතුණි.

(ආ) ගිවිසුම් ප්‍රකාරව බදු දී තිබූ කඩ කාමර 4 ක් වෙළඳ කටයුතු වලට භාවිතා නොකර, පදිංචිය සඳහා භාවිතා කර තිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

---

3.5.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

---

පැරණි උසාවි ගොඩනැගිල්ල පිහිටි ඉඩම මායිම් වැටක් ගසා ආරක්ෂා කර ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් මෙම ගොඩනැගිල්ල අනාරක්ෂිත තත්වයක පැවතුණි.

3.5.2 වත්කම් වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම

---

මොරයාය නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 5 ක් වසා දමා තිබූ අතර, කඩ කාමර 4 කින් 2017 දෙසැම්බර් 31 දිනට රු.5,880 ක කඩ කුලී හිඟයක් පැවතුණි.

3.5.3 පවරානොගත් වත්කම්

---

සමාලෝචිත වර්ෂයේ රු.529,764 ක වියදමක් දරා ඉදිකර තිබුණු උඩවෙල සතිපොළ භූමියේ පොදු වැසිකිළිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.5.4 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

---

මධ්‍යම පළාත් සභාවෙන් ලබා දී තිබුණු රු.1,500,000 ක් වටිනා කැබ් රථය ඇස්කීසි නියෝගයක් මත තහනමට ලක්කර තිබූ අතර, වාහනය දිරාපත් වෙමින් සභා භූමියේ පැවතුණි.

3.5.5 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

---

2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව පුස්තකාල 4 ක රු.20,245 ක් වටිනා පොත් 132 ක ඌනතාවයක් පැවතුණි.

3.6 ප්‍රසම්පාදනය
----------------

3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම
-------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළද සැලැස්මට අනුව මිලදීගැනීම් සිදුකර නොතිබුණි. ප්‍රසම්පාදන සලැස්මෙහි ඇතුළත් නොවන මිලදී ගැනීම්ද වර්ෂය තුළ සිදුකර තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
------------------------------------------

4.1 අයවැය පාලනය
--------------------

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තත්‍ය ආදායම් හා වියදම් අතර, සැළකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු අනාවරණය විය.

(අ) වැය විෂයන් 31 ක් සඳහා වෙන්කල රු.2,896,000 ක ප්‍රතිපාදන වලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ආ) ආදායම් විෂයන් 10 ක් සඳහා ඇස්තමේන්තුගත රු.3,082,000 ක ආදායමෙන් කිසිදු මුදලක් උපයාගෙන නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය
-------------------------

1988 (මුල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5(7) රීති ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපනය කර තිබූ නමුත්, අභ්‍යන්තර විගණනයට අමතරව වවුචර පරීක්ෂා කිරීම, කාල වාර්තා සකස් කිරීම වැනි සාමාන්‍ය කාර්යාල කටයුතු පැවරීම හේතුවෙන් අභ්‍යන්තර විගණනයට පවතින ඉඩකඩ සීමාවී පැවතුණි.

5. පද්ධති හා පාලන
----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | (i) | ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය නොකිරීම. |
| | | (ii) | ඇතැම් ස්ථාවර වත්කම් කිසිදු ප්‍රයෝජනවත් කාර්යයකට යොදවා නොතිබීම. |
| (ආ) | ගිණුම්කරණය | (i) | ඉදිකිරීම් ප්‍රාග්ධනිත නොකිරීම. |
| | | (ii) | ගිණුම් ශේෂ කීපයක් නිරවුල් නොකර පැවතීම. |
| | | (iii) | ණයහිමි හා ණයගැති ශේෂ අඩුවෙන් ගිණුම්ගත කිරීම. |
| (ඇ) | වාහන පාලනය | (i) | ලොග් සටහන් පොත් සහ දෛනික ධාවන සටහන්පොත් පවත්වාගෙන නොයාම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ආදායම් පාලනය | (i) | වෙළඳ සංකීර්ණවල කඩ කාමර තක්සේරු ක්‍රියාත්මක නොකිරීම. |
| | | (ii) | කාලීනව වරිපනම් බදු තක්සේරු නොකිරීම. |
| | | (iii) | වෙළඳ ආයතන පිළිබඳව වර්ෂය ආරම්භයේ සමීක්ෂණයක් නොපැවැත්වීම. |
| | | (iv) | හිඟ ආදායම් අය කර නොගැනීම. |
| | | (v) | පරිසර බලපත්‍ර නොමැතිව ව්‍යාපාර කටයුතු කරගෙන යාම. |
| (ඉ) | ණයගැතියෝ සහ ණයහිමියෝ | (i) | ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| | | (ii) | කර්මාන්ත ණයහිමි ශේෂ පියවීමට කටයුතු නොකිරීම. |
| (ඊ) | කොන්ත්‍රාත් පාලනය | (i) | ඉදිකිරීම් සඳහා ටෙන්ඩර් පටිපාටිය අනුගමනය නොකිරීම. |
| | | (ii) | ප්‍රජාපාදක සමිති වලට ලබා දුන් සංවර්ධන යෝජනා අසාර්ථක මට්ටමක පැවතීම. |